**මොණරාගල ප්‍රාදේශීය සභාව**

**මොණරාගල දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 01 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 ජුලි 05 දින ද විගණනයට ඉදිරිපත් කර තිබු අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 සැප්තැම්බර් 20 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

**1.2 මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මොණරාගල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

**1.3 මූල්‍ය ප්‍රකශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු වූ පොළිය රු.1,140,840 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම රු.275,703 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

## 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු.41,639,764 ක වත්කම්ද රු.15,086,281 ක්වූ වගකීම් හා රු.12,250 ක ගණුදෙණු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.98,726 ක් වූ අතර,ඊටප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,995,628 ක් විය.

## 2.2 අයවැය පාලනය

(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 14.1 වගන්තියට පටහැනිව පරිපූරක ඇස්තමේන්තු අනුමත කර නොගෙන අයවැය ගත ප්‍රතිපාදන ඉක්මවා රු.5,456,159 ක වියදම් දරා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයෙහි ඇස්තමේන්තු වියදම හා වර්ෂයේ තථ්‍ය වියදම අතර සියයට 29 සිට සියයට 153 දක්වා විචලනයක් පැවති හෙයින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් ,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| (i) | වරිපනම් හා බදු | 2,357 | 2,585 | 10,936 |
| (ii) | බදු කුලී | 9,654 | 10,563 | 1,179 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 740 | 646 | - |
| (iv) | වෙනත් ආදායම් | 9,350 | 12,072 | 10,545 |

### 2.3.2 වරිපනම් බදු

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 140(1) ප්‍රකාර 1988 වර්ෂයෙන් පසු මේ දක්වා වරිපනම් බදු තක්සේරු කර නොතිබුණි.

(ආ) සභාපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ ආදායම් විස්තරය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු රු.10,936,725 ක් වූ අතර ගිණුම අනුව රු.2,807,283 වූයෙන් රු.8,129,442 ක වෙනසක් විය.

### 2.3.3 බදු කුලී

(අ) 2012 වර්ෂය සඳහා සභාව සතු ගව මස් කඩය රු.2,232,164 කට හා කුකුල්මස් කඩය රු.100,000 ක බදු මුදලකට රජයේ ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය නොකර බදු දී තිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 136 වන වගන්තිය ප්‍රකාරව සභාව සතු කඩ කාමර කුලී තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ ආදායම් විස්තරය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ බදු කුලී රු.1,179,406 ක් වූ අතර ගිණුම අනුව හිඟ බදු කුලී කිසිවක් නොවිය.

## 2.3.4 වෙනත් ආදායම්

(අ) අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර ගැනීමට කටයුතු නොකිරීම නිසා කුලී ත්‍රීරෝද රථ සංගම්වලින් ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය විධි විධාන ප්‍රකාර 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති හෝ එම අධිකාරිය අනුමත කර ඇති ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන හෝටල් / ලැගුම්හල්වලින් අතුරු ව්‍යවස්ථා පනවා අදාල වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම්වලින් සියයට 1 නොඉක්මවන ගාස්තුවක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව විසින් ප්‍රදේශයේ වෙළඳ ආයතන 109 කට පමණ ජලය සැපයීම සිදු කරන අතර එම ආයතන සඳහා ජල මනු සවි නොකර විධිමත් පදනමකින් තොරව රු.30 සිට රු.2,500 දක්වා විවිධ ගාස්තු අයකර තිබුණි.

(ඈ) සභාපතිවරයා විසින් සපයා තිබූ ආදායම් විස්තරය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රු.10,545,507 ක් වූ හිඟ හිටි වෙනත් ආදායම, ගිණුම අනුව රු.8,408,629 ක් වූයෙන් රු.2,136,878 ක වෙනසක් විය.

## 2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

<u>රු.</u>

(i) උසාවිදඩ 510,499

(ii) මුද්දර ගාස්තු 1,626,379

**2.4 අධිභාර**

--------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (3) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවළුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුලදී පනවන ලද අධිභාර සම්බන්ධයෙන් 2012 දෙසැම්බර් 31 දිනට රු.922,195 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

**2.5 අක්‍රිය ගිණුම්**

------------

මහජන බැංකුවේ පවත්වා තිබූ අංක 176752844 දරණ බැංකු ගිණුම අක්‍රීය තත්ත්වයේ පැවති අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.31,075 ක ශේෂයක් පැවතිණි.

**2.6 ආර්ථික නොවූ ගණුදෙනු**

-------------------------

2012 පෙබරවාරි 28 දින සභා තීරණයක් මත අක්කරයක ප්‍රමාණයක රබර් පැල තවාන් ව්‍යාපෘතියක් ආරම්භ කර තිබූ අතර ඒ සඳහා අවශ්‍ය බිම් සකස් කිරීම හා අනෙකුත් ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා රු.106,430 ක වියදමක් දරා තිබුණි.එහෙත් එම ව්‍යාපෘතිය මේ වන විට සම්පූර්ණයෙන්ම අසාර්ථක වී ඇති බවට වාර්තා වි තිබූ අතර රබර් ඇට තවාන් කිරීම සඳහා මිලදී ගෙන ඇති රු.49,200 ක් වටිනා පොලිතීන් මළු 12,000 ක් ගබඩාවේ විය.

**2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

**පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.**

(අ) ගිණුම් අංක 136752849 දරන ජංගම ගිණුමෙන් නිකුත් කර මාස 06 ක් ඉක්ම වූ රු.49,276 ක් වටිනා චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 1992 වර්ෂයේදී විදුලිය සැපයීම ලංකා විදුලි බල මණ්ඩලයට පැවරීමේදී සභාවට අයවිය යුතු රු.4,771,469 ක් අයකර ගැනීමට කටයුතු නොකර දීර්ඝ කාලයක් තිස්සේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඇ) ආයතන දෙකකට ගෙවිය යුතු රු.5,957,883 ක මුදලක් නිරවුල් නොකර දීර්ඝ කාලයක් තිස්සේ ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඈ) සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන UPRC - 1112 අංක දරන ට්‍රැක්ටරය හා UPRW 1980 දරණ ට්‍රේලරයේ අයිතිය පළාත්පාලන අමාත්‍යාශයෙන් පවරා ගැනීම ප්‍රමාදවීම හේතුකොටගෙන දඩ මුදල් වශයෙන් රු.57,900 ක මුදලක් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට ගෙවීම් කර තිබුණි.

(ඉ) සභාව සතු RS 1800 මෝටර් ග්‍රේඩරයේ ඉදිරිපස වීදුරුවට(windscreen)2010 නොවැම්බර් 05 දින අලාභ හානි සිදු වී ඇති අතර අලාභයේ ඇස්තමේන්තු වටිනාකම රු.80,528 ක් විය.මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි 103 හා 104 පරිදි කටයුතු කර අලාභය අදාල පාර්ශවයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ස්ථාන මාරු වී ගිය හා අනියම් පදනම මත සේවයට බඳවා ගත් දැනට සේවයේ නොමැති සේවකයින් 35 දෙනෙකු ගෙන් රු.507,463 ක ණය ශේෂයක් අය නොවී පවතී.

(උ) විවිධ කාර්යයන් සඳහා මිලදී ගත් රු.937,240 ක් භාණ්ඩ සඳහා රජයේ මුදල් රෙගුලාසි 237 (ආ) ප්‍රකාරව තොග සහතික ලබාගෙන නොතිබුණි.

(ඌ) 2012 වර්ෂය සඳහා මසකට රු.8,000 බැගින් රු.96,000 ක් සභාව විසින් සභාව පවත්වාගෙන යන ගොඩනැගිල්ල සඳහා කුලී ගෙවා තිබුණි.2012 අගෝස්තු 28 වන දින සිට නැවත ගොඩනැගිල්ල අයිතිකරුට ආපසු බාරදී තිබූ අතර මාස 04 ක් වෙනුවෙන් වැඩිපුර ගෙවන ලද කුලිය රු.32,000 ක මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 03. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය